# මාවෙල ගල්ලෙන් රජමහා විහාරය ආශ්‍රිතව වර්තමානයේ එය විනාශ වීමට බලපානු ලබන හායනකාරක පිළිබඳ ගවේෂණාත්මක අධ්‍යයනයක්

කේ.එම්.එම්.එස්.කේ. අබේසිංහ

පුරාවිද්‍යාව හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
abesinghesanju@gmail.com

**මුඛ්‍ය පද** - මාවෙල ගල්ලෙන් රජමහ විහාරය, ස්මාරක, හායනකාරක

## හැඳින්වීම

ස්මාරකයන් වනානි අතීතයට අයත් ජන කණ්ඩායමක් හෝ සංස්කෘතියක් විසින් නිර්මාණය කර තිබෙන්නා වූ වාස්තුවිද්‍යාත්මක, ඉංජිනේරුමය හා සෞන්දර්යයාත්මක අංගයන් වන චිත්‍ර සහ මූර්ති ඇතුළත් නිර්මාණයන් ය. එසේම ස්වාභාවිකව පිහිටා ඇති ගල්ලෙන් ආදිය ද ඒවා මානව මැදිහත්වීමකින් සකස් කර ඇත්නම් එවැනි නිර්මාණයන් ද, එම සෑම නිර්මාණයක් ම නිර්මාණය කර ඇති පරිසරය ද ස්මාරක වශයෙන් අර්ථ දක්වනු ලැබේ. අප රට තුළ මෙන්ම ලෝකය පුරාම විවිධ වූ ස්මාරකයන් තිබෙන අතර දීර්ඝ කාලයක් පුරාවට පැවත එන මෙම ස්මාරක ක්‍රමක්‍රමයෙන් විවිධ හේතු කාරණා නිසා විනාශ වීම සිඳු වේ. වර්තමානය වන විට ලෝකයේ ගෝලීයකරණය හේතුවෙන් දේශගුණික, පාරිසරික සමාජයීය මෙන්ම මානව සංකල්ප ආදී සෑම අංශයකම ඇතිව තිබෙන්නා වූ වෙනස්වීම් වර්තමානයේ මෙම ස්මාරකවල විනාශය සීඝ්‍ර කිරීමට හේතු වී තිබේ.

ඒ අනුව ශ්‍රී ලංකාව තුළ තිබෙන්නා වූ වැදගත් පුරාවිද්‍යා ස්මාරකයක් වශයෙන් මාවෙල ගල්ලෙන් රජමහා විහාරය වැදගත් වන අතර එමෙන් ම මෙම ස්මාරකය වර්තමානය වන විට සීඝ්‍ර ලෙස හායනයට පත් වන්නකි. මෙම මාවෙල ගල්ලෙන් රජමහා විහාරය වළගම්බා රජු විසින් කරවන ලදැයි සැළකෙන අතර පහළ කඩුගන්නාවේ, හිඟුල මාවෙල ගම්මානයේ කෑගලු සහ මහනුවර දිස්ත්‍රික් මායිමේ ඉතාමත් රමණීය වූ පරිසරයක මෙම ඓතිහාසික විහාරය පිහිටා තිබේ. කොළඹ -මහනුවර මාර්ගයේ කඩුගන්නාව අම්බලම අසල දකුණු පසින් වූ මාර්ගයෙන් පහළට බැස මීටර 200ක් පමණ ගමන් කිරීමෙන් මෙම විහාරයට පිවිසිය හැක. කඳු බෑවුමක් ඔස්සේ ඇදී යන දික් පර්වත තලාවක් ඇසුරු කොට ගෙන මෙම විහාරය කරවා ඇති අතර මෙහි කටාරම් කොටන ලද ලෙන් තුනකි. ඒ අනුව පළමු ලෙනෙහි දා ගැබද, දෙවැනි ලෙනෙහි විහාර මන්දිරය ද, තෙවැනි ලෙනෙහි සංඝාවාසය ද පිහිටා තිබේ. එමෙන් ම මෙම පර්වතයට ඉහළින් වන වඳුලු සහිත වටපිටාවක් පැතිර පවතින අතර මෙම ලෙන් විහාරය වටා ඉතාමත් නිස්කලංක පරිසරයක් වේ. එමෙන් ම මෙම මාවෙල ගල්ලෙන් රජමහා විහාරයෙහි ලෙන් ආශ්‍රිතව හා එහි ඇති කොරවක්ගලක පූර්ව බ්‍රාහ්මී අක්ෂර සහ ලෙන් ලිපි සතරක් වේ. ඒ අනුව මෙම මාවෙල ගල්ලෙන් රජමහා විහාරය ආශ්‍රිතව වර්තමානයේ එය විනාශ වීමට බලපානු ලබන හායනකාරක පිළිබඳ ගවේෂණාත්මක අධ්‍යයනයක් කිරීම මෙම පර්යේෂණයේ අරමුණයි.

## ක්‍රමවේදය

මෙම පර්යේෂණය සිදු කිරීමේ දී පර්යේෂණ ක්‍රමවේදය ලෙස ප්‍රධාන වශයෙන් ක්ෂේත්‍ර ගවේෂණය සිදු කරන ලද අතර ඒ අනුව මෙම ක්ෂේත්‍රය පුරා ගවේෂණය කරමින් ඡායාරූපකරණය සිදු කරන ලදි. එමෙන් ම සාහිත්‍යය මූලාශ්‍ර හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයන් පරිශීලනය ද මෙහි පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් යොදා ගත් අතර එමෙන් ම වැඩි දුරටත් තොරතුරු තහවුරු කරගැනීම සඳහා සම්මුඛ සාකච්ඡා පැවැත්වීම ද සිදුකරන ලදි.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

මාවෙල ගල්ලෙන් රජමහා විහාරය ආශ්‍රිතව වර්තමානයේ එය විනාශ වීමට බලපානු ලබන හායනකාරක පිළිබඳව සිදුකරන ලද ගවේෂණාත්මක අධ්‍යයනයේ දී මෙම ස්මාරකය විනාශ

වීමට හායනකාරක ප්‍රබල ලෙස ඉවහල්ව ඇති බව පැහැදිලි වේ. ඒ අනුව මෙම විහාර භූමිය ආශ්‍රිතව සිදු කරන ලද ගවේෂණය මඟින් මෙම ස්මාරකය විනාශ වීමට පහත හායනකාරකයන් ප්‍රබල ලෙස ඉවහල්ව ඇති බව පැහැදිලි වේ.

- භෞතික විද්‍යාත්මක හේතුකාරක.
- තෙතමනයේ බලපෑම
- දේශගුණික සහ කාළගුණික විපර්යාස
- ජීවී හා ක්ෂුද්‍ර ජීවී හානිකාරක
- මානව ක්‍රියාකාරීත්වය
- අත්හැර දැමීම

මාවෙල ගල්ලෙන් රජමහ විහාරය ආශ්‍රිතව එය විනාශ වීමට බලපානු ලබන ප්‍රධාන හායනකාරකයන් ලෙස භෞතික විද්‍යාත්මක හේතු කාරක වැදගත් වේ. භූමියේ ඇතිවන විවිධ බලපෑම් තත්ත්වයන් හේතුවෙන් සිරස් පීඩනය සහ තිරස් පීඩනය ඇති වී ස්මාරකයේ ඒකාග්‍රතාවයට හානි සිදු වී ස්මාරකය විනාශ වීම පිළිබඳව සාධක මෙම විහාර පරිශ්‍රය ආශ්‍රිතව ඇති පැරණි රජ දවස ඉදි කළ ගොඩනැගිලි ආශ්‍රිතව සිදු කළ ගවේෂණය ඔස්සේ හඳුනාගත හැක. එමෙන් ම මේ ආශ්‍රිතව ඇති හායනකාරක අතර තෙතමනයේ බලපෑම බහුලව ම දැකගත හැක. වර්ෂාව මේ සඳහා බලපාන ප්‍රධාන කාලගුණික හා දේශගුණික සාධකය වන අතර මෙම ස්මාරකය ආශ්‍රිතව කුඩා දිය ඇල්ලක් මෙන්ම ජල උල්පත් රාශියක් පවතින බැවින් මෙම භූමිය නිරන්තරයෙන් තෙතමනයෙන් යුක්ත වේ. එමෙන්ම අව්ව, වැස්ස සහ සුළඟ ආදී දේශගුණික සහ කාළගුණික සාදක හා ඒ ආශ්‍රිතව ඇතිවන විවිධ සංසිද්ධීන් මෙම ස්මාරකයේ හායනය වේගවත් කර තිබේ. එමෙන් ම මෙම විහාරය තරමක් වනබදව පිහිටා ඇති අතර, එබැවින් මේ ආශ්‍රිතව වන සතුන් බහුලව දැකගත හැක. මෙම පුරාණ විහාර පරිශ්‍රය ආශ්‍රිතව රිලවුන්, කුරුල්ලන් හා වවුලන් ආදී සතුන් වාසය කරන අතර මෙහි ලෙන් ආශ්‍රිතව ඇති පැරණි ගොඩනැගිලිවල දැව ආශ්‍රිතව වේයන් හා කෘමීන් ආදී සතුන්ගෙන් සිදුව ඇති හානි බහුලව ම දැකගත හැක. එමෙන් ම ඕනෑම ස්මාරකයක් හායනයට මානව ක්‍රියාකාරීත්වය ප්‍රබල ලෙස ඉවහල් වන අතර මෙම විහාරය දැඩි ලෙස නිධන් සොරුන්ගේ ග්‍රහණයට නතු වූවක් වන අතර මෙහි පළමු ලෙනෙහි ඇති දාගැබ සහ දෙවැනි ලෙනෙහි ඇති සුවිසල් සැතපෙන බුද්ධ ප්‍රතිමාව ද අවස්ථා කිහිපයකදීම නිධන් සොරුන්ගේ ග්‍රණයට නතුව තිබේ. එමෙන් ම මෙම විහාරය ආශ්‍රිතව ඇති ඇතැම් අංග ප්‍රතිසංස්කරණයකින් තොරව අතහැර දමා ඇති ආකාරයක් දැක ගත හැක. ඒ අනුව මෙම ස්මාරකයන් පුරාවිද්‍යාත්මක වශයෙන් ඉතාමත් වැදගත් වන අතර නමුත් මේ පිළිබඳව හැඟීමක් නොමැතිකම හේතුවෙන් වර්තමානයේ සීග්‍රයෙන් හායනයට ලක් වෙමින් පවතී. ඒ අනුව මෙම වටිනා උරුමයන් විනාශ වීමට ඉඩ නොදී අනාගතය සඳහා දායාද කළ යුතුය.

**ආශ්‍රිත මූලාශ්‍රය**

Ambanwala, C.B. & M. Karunaratna, (2009) Another Approach to the Malaya Desa in Ancient Sri Lanka: New Archaeological Revelation in and around Pahala Mavela Temple at Kadugannava, ***Peradeniya University Research Sessions-PURSE 2009***, University of Peradeniya, Sri Lanka.

Bell, H.C.P. (1904) ***Report on The Kegalla District of the Province of Sabaragamuwa***, Archaeological Survey of Ceylon.

Nandadeva, B.D. (1986) Rock Art Sites of Sri Lanka: A Catalogue, ***Ancient Ceylon No. 6***, Department of Archaeology, Sri Lanka.